# හින්දු දහම හා එහි පූජ්‍ය ග්‍රන්ථ

- හල්පිටියේ සමිතසිරි හිමි

ඉන්දියානු අර්ධ ද්වීපයේ කෝටි පනහක පමණ ජනගහනයක් අදහන හින්දු ආගම ලෝකයේ පැරණිතම ආගම් අතරින් එකකි. ඉන්දියානු ශිෂ්ටාචාරයට ආවේනික වූ මෙම ආගම 'හින්දු ආගම' යනුවෙන් හැඳින්වෙන්නට වූයේ ඉතාමත් මෑත යුගයක සිට ය. එය ඉන්දියාව හා ආශ්‍රයට වැටුන පිටරැටියන් විසින් තනන ලද නමකි. 'ඉන්දියාව' යන නමට සේම 'හින්දු' යන්නටද එක සේ මුල් වී ඇත්තේ ප්‍රදේශයේ ප්‍රධාන ගංගාවකට දී තිබුණ 'සින්දු' හෙවත් 'ඉන්දුස්' යන නම ය.[1]

හින්දු යන නමින් හැඳින්වෙන ආගම කෙටියෙන් හෝ නිරවුල්ව හැඳින්වීම එතරම් පහසු නැත. එයට එක ආරම්භකයෙක් නැත. නිල සම්මත ධර්ම සිද්ධාන්ත මාලාවක්ද නැත. එපමණක් නොව, එය කෙතරම් විවිධාකාරව අදහනු ලබනවාද කිවහොත් එය එක ආගමක් සේ ගත හැක්කකට වඩා ආගම් සමූහයක එකතුවක් නොහොත් සංගමයක් සේ ගත යුත්තකි. හින්දු නමින් හැඳින්වෙන ඇදහිලික්‍රම එකිනෙකින් කෙතරම් වෙනස් වුවද, එකම ගසක ශාඛාවලට සේ එයටද පොදු මුලක් ඇතැයි කිව යුතුව ඇත. ඒ පොදු මුල වේදය ය.

වේදය අද එතරම් බහුලව කියවනු ලබන හෝ පිළිපදිනු ලබන කෘතියක් නොවන්නට පුළුවන. එහෙත් එයට ගරු නොකරන හින්දු භක්තිකයෙක් නැත. එක්තරා මධ්‍යකාලීන දාර්ශණිකයෙක් පවසා ඇති පරිදි වේදය ප්‍රතික්ෂේප නොකරන කවරෙක් වුවද හින්දු භක්තියෙකි. ඒ අනුව ගත්විට මුස්ලිම්, ක්‍රිස්තියානි, බෞද්ධ හෝ සික් නොවන හැම ඉන්දියානු ජාතිකයෙක්ම හින්දු භක්තියෙකි. හින්දු ආගම අද ඉන්දියාවටම සීමා වූ ආගමක්ද නොවේ.[2]

ඉන්දියාවෙන් පැමිණි ජන කණ්ඩායම් වසන ලංකාව, බංගලදේශය, මැලේසියාව වැනි රටවලද හින්දු ආගම දක්නට ලැබේ. ඉන්දියානු නොවන හින්දු භක්තික සංඛ්‍යාවක්ද අද බටහිර ලෝකයේ සිටිති.

ඉන්දියාව ඈත අතීතයේ සිටම මිනිස් වාසයට ලක් වූ රටකි. එම නිසාම ඉන්දියානුවෝ විවිධ ජන වර්ගවලින් සමන්විත වෙති. ක්‍රි.පූ. 2500ට පෙර පවා විවිධ ගෝත්‍රිකයෝ එහි වාසය කර ඇත. ඔවුන් අතරින් කලු හමකින්ද කැරලි සහිත කෝන්ඩයකින්ද යුක්ත වූ ද්‍රවිඩයෝ ප්‍රධාන වූහ. ඔවුන් ඉන්දියාවේ ප්‍රධාන ජනතාව වී සිටි අතරතුරේ, එනම් ක්‍රි.පූ. 1500ටත් 1200ටත් මැදිවූ යුගයකදී, වයඹ දිගින් එක්තරා පිරිසක් ඇතුළු වූහ. 'ශ්‍රේෂ්ඨ' යන අර්ථය ඇති 'ආර්ය' යන නමින් මොවුන් තමන් හැඳින්වූහ. අශ්වාරෝහක රථවාහන වැනි යුද්ධමය උපකරණවලටද හුරු වී සිටි මොවුන්ට ඉන්දියාව තුළ එවිට බලවත්ව සිටි ද්‍රවිඩ ජනතාව ඇතුළු විවිධ ජන කණ්ඩායම් යටපත්කර ගැනීම එතරම් දුෂ්කර නොවීය.

ආර්ය ජාතිකයෝ තරමක් උස එසේම ලාකලු පැහැයකින් යුත් පිරිසක් වූහ. කෘෂිකර්මය හා සත්ව පාලනය ඔවුන්ගේ ප්‍රධාන රැකියා මාර්ග විය. මොවුහු ඉන්දු යුරෝපීය භාෂාවක් කථා කළහ. සංස්කෘත භාෂාව බිහිවී ඇත්තේ එයිනි. ඔවුන්ගේ ශිෂ්ටාචාරයට හා ආගමට ග්‍රීකවරුන්ගේද, රෝමවරුන්ගේද ඉරාන ජාතිකයින්ගේ ශිෂ්ටාචාරවල ආභාසය ලැබී තිබුණේය.

පූර්ව ආර්ය හෙවත් ද්‍රවිඩ යුගයේ ආගම හා සංස්කෘතිය පිළිබඳව අපට තවමත් ලබාගත හැකි තොරතුරු ඉතාමත් අල්ප ය. මෙම ශතවර්ෂයේ මුල් භාගයේදී ඉන්දුස් ගංගා නිම්නයේ කරන ලද කැනීම්වලින් නම් ද්‍රවිඩ ශිෂ්ටාචාරය ගැන මූලික කරුණු රැසක් සොයාගැනීමට පුරාවිද්‍යාඥයන් සමත් වී ඇත. එම සොයාගැනීම් අනුව පූර්ව ඉන්දියානු ද්‍රවිඩ ශිෂ්ටාචාරය ඉතාමත් උසස් මට්ටමක එකක් වී ඇත. ඉතාමත් දියුණු නාගරික සමාජ ක්‍රමයක් ඔවුන්ට තිබී ඇත. ද්‍රවිඩ ජනතාව කථාකළ භාෂා අතරින් හතරකට උසස් මට්ටමක සාහිත්‍යයක් තිබී ඇත. දෙමළ භාෂාව



ඒවායින් එකකි. එයට අයත් සාහිත්‍යය අවුරුදු දෙදහසක් පමණ පැරණි ය.[3]

ද්‍රවිඩ ශිෂ්ටාචාරය ගැන තවමත් ලැබී ඇති තොරතුරුවල සීමිතභාවය නිසා හින්දු ආගමේ නූතන ස්වරූපයට එයින් ලැබී ඇති ආභාසය තීරණය කිරීම උගහටය. ඒ අතින් ආර්ය ශිෂ්ටාචාරයේ තත්ත්වය ඊට වඩා පැහැදිලි ය. හින්දු ආගමේ හැඩගැස්මට එයින් ලැබී ඇති ආභාසය පැහැදිලි ය. එය අති විශාලය. එම සාහිත්‍යයට අයත් කෘති මොනවාද කියා බැලීමට ප්‍රථම හින්දු බැතිමත්හු විශ්වය ගැනද, ජීවිතය ගැනද, සමාජය ගැනද සිතන විලාසය සලකා බැලීම ප්‍රයෝජනවත් විය හැක.

හින්දු ආගම දේව විශ්වාසය පදනම් කරගත් ආගමක් වුවද ඒ දේව විශ්වාසය බැතිමතුන් විසින් විස්තර කරනු ලබන විලාසය හැම විටම ඒකාකාර නොවේ. ඇතැම්හු එකම දෙවිකෙනෙකු පිළිගනිති. ඒ දෙවියන් නිර්පුද්ගල ස්වරූපයෙන් හෝ පුද්ගල ස්වරූපයෙන් හෝ ගනිති. ඇතැම්හු දෙවි දේවතාවන් සමූහයක් අදහති. එහෙත් ඒ දෙවිදේවතාවන් නිරූපිත එකම දෙවියන්ගේ විවිධ ස්වරූප සේ සලකති.

දෙවියන් හා විශ්වය අතර සම්බන්ධයද විවිධ බැතිමත්හු විවිධාකාරව දක්වති. ඇතැම්හු දෙවියන් හා විශ්වය යන දෙකම එකම පරම සත්‍යයට ඇතුළත් යැයි ප්‍රකාශ කරති. ඔවුන්ගේ අදහස අනුව පවතින සෑම දෙයක්ම දේව ආත්මය (පුරුෂ) හා පරම භෞතික ද්‍රව්‍ය යන දෙකේ සම්මිශ්‍රණයකි. තවත් සමහරු දෙවියන් හා විශ්වය යන දෙක සම්පූර්ණයෙන්ම නොවේනම් එක්තරා ප්‍රමාණයකට හෝ එකිනෙකට වෙනස් යැයි සිතති. දෙවියන් පිළිබඳ විස්තරවල මෙම විවිධත්වයට පදනම වේද ග්‍රන්ථවලම දක්නට ලැබේ. ඍග් වේදයේම ප්‍රකාශ වී ඇති පරිදි 'සත්‍යය එකක්ම ය. එහෙත් පඬිවරු එය විවිධ නම්වලින් අමතති.'

හින්දු බැතිමතුන් විසින් ධර්ම සත්‍යතා සේ ගනු ලබන කරුණු ගොනු කර දැක්වීම තරමක් දුෂ්කරය. එහෙත් පහත දැක්වෙන කරුණු ඒවා අතරින් ප්‍රධානයැයි කිව හැක.

(1) පරම සත්‍යය බ්‍රහ්මන් ය.

එය පුද්ගල හෝ නිර්පුද්ගල හෝ විය හැක. විවිධ දේවරූපවලින්ද එය හැඳින ගැනීමට පුළුවන.

(2) එකම නිත්‍ය සදාකාලික සත්‍යය බ්‍රහ්මන් ය.

ඉන්ද්‍රියගෝචර වස්තූන් අනිත්‍ය ය. තාවකාලිකය. නිත්‍ය සේ ඒවා පෙනේනම් ඒ මායාවක් පමණි.

(3) බ්‍රහ්මන් යනුවෙන් හැඳින්වෙන ඒ සත්‍යය අවබෝධකර ගැනීමට හා අත්දැකීමට ක්‍රම කිහිපයක් ඇත. තුනක් ප්‍රධානය.

පළමුවැන්න

(1) ඥාන මාර්ගය ය.

(බ්‍රහ්මන් විශ්වයේ ආත්මයද (ආත්මන්) වන නිසා තමන් හා දෙවියන් එකක්ම වන බව භාවනාවෙන් අවබෝධ කර ගැනීම) ඒ ක්‍රමය ය.

දෙවැන්න

(2) භක්ති මාර්ගය ය.

(තමන් විසින් තෝරාගන්නා ලද එක දෙවිකෙනෙකු හෝ දෙවගනකවෙත භක්ති පූජා පවත්වා එම දෙවියන් හා එක්වීම) ඒ දෙවෙනි ක්‍රමය ය.

තුන්වැන්න

(3) කර්ම මාර්ගය ය.

(සමාජයෙන් තමන් වෙත පැවරී ඇති යුතුකම් හරියාකාර ඉටුකර එමගින් දෙවියන් හා එක්වීම) ඒ තෙවෙනි ක්‍රමය ය.



(4) එවැනි ක්‍රම වලින් දෙවියන් හා එක්වූ ඍෂිවරුන් හා සාධුවරුන් බැතිමත්හු ආදර්ශයට ගෙන ඔවුන් අනුගමනය කළ යුතු ය. ගුරු කෙනෙකු යටතේ එම ක්‍රම හැදෑරිය යුතුය.

(5) හින්දු භක්තිකයෙක් වේදයේ ධර්ම ආධිපත්‍යය පිළිගත යුතුය.

(6) මිනිසා තම වැඩිහිටි ජීවිතය පියවරවල් හතරකට බෙදා එය ක්‍රමවත්ව සකස්කර ගත යුතුය. ඒ පියවරවල් 'ආශ්‍රම' ලෙස හැඳින්වේ. පළමුවෙන් ඔහු වේදයේ ශිෂ්‍යයෙකු වී බ්‍රහ්මචාරීව ජීවත්විය යුතුය. දෙවනුව, ඔහු විවාහ වී ගෘහස්තයෙකු විය යුතුය. තුන්වෙනුව දූදරුවන් සඳහා අවශ්‍ය කටයුතු කලාට පසු තම බිරිඳද සමග වනයට වැදී භාවනායෝගීව වනප්‍රස්ථ ජීවිතයක් ගත කළ යුතුය. හතරවෙනුව සන්නාසයෙකු වශයෙන් ජීවත්වෙමින්, ලැබෙන භික්ෂාවෙන් යැපෙමින්, තනියම ජීවිත අවසානයට සූදානම් විය යුතුය.

(7) තම ජීවිත කාලය තුළ කෙනෙකුට දිනාගැනීමට අපේක්ෂා කළ හැකි අරමුණු හතරක් ඇත.

පළමුවැන්න

(I) ධර්ම අවබෝධය (ධර්ම) ය.

දෙවැන්න

(II) ආර්ථික සම්පත් හෙවත් භෞතික සඵලත්වය (අර්ථ) ය.

තුන්වැන්න

(III) කායික තෘප්තිය (කාමය) ය.

හතරවැන්න

(IV) ආධ්‍යාත්මික විමුක්තිය (මොක්ෂ) ය.

(8) සමාජයේ යහපැවැත්මට එය වර්ණ හෙවත් කුල ක්‍රමය අනුව සකස්විය යුතුය. ප්‍රධාන කුල හතරකි. ඒවා නම් බ්‍රාහ්මණ හෙවත් පූජක ක්ෂත්‍රිය හෙවත් රාජ්‍ය පාලක, වෛශ්‍ය හෙවත් වෙළඳ හා ශුද්‍ර හෙවත් කම්කරු වේ. හැම කෙනෙක්ම තම කුලය අනුව ක්‍රියා කර සමාජයේ ස්ථාවරභාවය හා සමබරතාවය රැකගත යුතුය.[4]

හින්දු ආගමේ හැම නිකායිකයෙක්ම මෙම කරුණු පොදුවේ පිලිගන්නවා යැයි කිව හැක. ඒවායින් සමහරකට විරුද්ධත්වය දැක්වූ බෞද්ධ, ජෛන හා සික් වැනි කණ්ඩායම් හින්දු ආගමෙන් වෙන්වී ස්වාධීන ආගම් බවට පත්වූහ.

## හින්දු ආගමික පූජ්‍ය ග්‍රන්ථ

හින්දු ආගමේ පූජ්‍ය ලියවිලි කොටස් දෙකකට බෙදේ. එකක් 'ශ්‍රැති' ය. අනික 'ස්මෘතිය.'ශ්‍රැති' යන වචනයේ අර්ථය 'ඇසුණු' හෙවත් අසන්නාට ලැබුණු යන්න ය. ස්වභාධර්මයට හා හෘදසාක්ෂියට ඇහුම්කන් දීමෙන් ඍෂිවරුන් අවබෝධ කරගත් ජීවිත කරුණු ඇතුළත් පොත් එම ගණයට අයත් වේ. එම කරුණු 'දෙවියන් විසින් අනාවරණය කරන ලද ඒවා' සේද සැලකේ.

'ස්මෘති' යන වචනයේ අර්ථය 'මතකය' හෙවත් 'මතකයෙන් රැකගන්නා ලද්ද' යන්න ය. මෙම කොටසට අයත් පොත් අතිශයින් වැදගත් වුවද දේව කතෘත්වයකින් බිහිවූ ඒවා සේ නොගැනේ. එහෙත් එම ගණයට අයත් පොත් අතර භගවත් ගීතාව වැනි කෘති කිහිපයක් පොදු ජනයා අතර ගැනෙන්නේ පළමු ගණයට අයත් එනම් දේව කතෘත්වයකින් බිහිවූ ඒවා සේ ය.

### 1. ශ්‍රැති

ශ්‍රැති ගණයට පොත් වර්ග තුනක් අයත් වේ. ප්‍රථම සේම ප්‍රධානතම වර්ගය 'වේද' ග්‍රන්ථ වේ. 'බ්‍රහ්මණ' යනුවෙන් හැඳින්වෙන දෙවැන්න වේද ග්‍රන්ථවල අටුවා ටීකා හෝ විස්තර වේ. එහෙත් ඒවා බ්‍රාහ්මණ පූජකවරුන්ට විශේෂ වූ අධ්‍යාපන පොත් කාණ්ඩයකි. තුන්වැන්න 'උපනිෂද්' ය. වේදය මුල්කරගෙන නිර්මාණය කර ඇති මෙම කෘති 'වේදයේ කෙලවර' යන අර්ථය ඇති 'වේදාන්තය' යන නමින් ද හැඳින්වේ.

(අ) වේද ග්‍රන්ථ: 'වේදය' යන වචනයේ අර්ථය 'විද්‍යාව' 'දැනුම' යන්නය. දිව්‍යමය දැනුම යන්නට සමාන අර්ථයකින් එය



හින්දු බැතිමතුන් අතර ගනු ලැබේ. වේද ග්‍රන්ථ ගණයට අයත් පොත් හතරක් ඇත. ඒවා නම් ඍග්වේදය, සාම වේදය, යජුර් වේදය හා අථර්වන් වේදය ය.

ඒවා ක්‍රි.පූ (ක්‍රිස්තු පූර්ව) 1800 හා 800 අතර කාල පරිච්ඡේදයේදී නිර්මාණය වී ඇතැයි පඬිවරු පවසති. නමුත් ඒ කාලයේදීම ඒවා ලේඛන ගත කෙරුණේ නැත. ඒවා ලේඛන ගත වී තිබෙන්නේ ක්‍රි.ව. 04 වෙනි ශත වර්ෂයේදී ය. අවුරුදු 2000ක පමණ කාල පරිච්ඡේදයක් තුළ ඒවා රැකී ඇත්තේ මතකයෙන්මය. පැරණි කාලවල උගතුන් පොත්පත් මතකයෙන්ම රැකගත් විලාශය නූතන කවරෙකුට වුවද විශ්ම ජනක වනු නොඅනුමානය.

වේද ගණයට අයත් පොත් හතරින් පළමුවැන්න ඍග් වේදය ය. 'ඍග්' යන්නේ අර්ථය 'ප්‍රශංසා' යන්නය. 'ප්‍රශංසා වේදය' සේද හැඳින්විය හැකි මෙය අතිත් තුනටම වඩා පැරණිය. එය ක්‍රිස්තු පූර්ව 1800ටත් 1500ටත් අතර නිර්මාණය වී ඇතැයි විශ්වාස කෙරේ. මෙය දේව ප්‍රශංසාව අරමුණු කරගත් ගීතිකා 1017 කින් සමන්විත වේ. එම ගීතිකා සමූහය 'මණ්ඩල' හෙවත් පොත් කාණ්ඩ පහකට බෙදා ඇත. දසවෙනි මණ්ඩලයේ හින්දු බැතිමතුන් අතර ඉතාමත් ජනප්‍රිය විශ්ව නිර්මාණ ගීතිකාවද මිනිසා පිළිබඳ ගීතිකාවද දක්නට ලැබේ. ප්‍රශංසාවෙන් පුදනු දෙවිවරුන් අතරින් අග්නි, ඉන්ද්‍ර හා වරුණ ප්‍රධාන වේ. වරුණ දෙවියන් සඳහා වූ එක ගීතිකාවක් මෙසේ ය.

අහස හරහා ඉගිලී යන කුරුල්ලන්ගේ
ගමන් මාර්ගය ඔහු දන්නේ ය.
මුහුදේ දෙවියන් වන ඔහු එය මත/යාත්‍රා
කරන නැව් හඳුනන්නේ ය.
හුළඟ පැතිරෙන්නේ ය. ඉහලට යන්නේ ය
බලවත්ය. එහෙත් ඔහු හුලගේ ගමන්මග දන්නේ ය.
ඉහල වසන දෙවිවරුන් ඔහු දන්නේ ය.
දිව්‍ය සැලැස්ම අනුගමණය කරමින් තම
ජනයා අතර එකට වාඩිවෙන්නේ ය.

අති ප්‍රඥාවන්ත ඔහු එතැන ඉඳගෙන
සියල්ල පාලනය කරන්නේ ය.
වරුණ දේවේන්ද්‍රයාණෙනි, මගේ හඬට
ඇහුම්කන් දුන මැනව.
මේ දවස තුළ අපට කරුණාබරිත වුව මැනව.
ඔබේ සහය මම ඔබෙන් අයදිමි.
ප්‍රඥාවන්ත ඔබ හැම කෙනෙකුගේම සමිදාණෝය.
මෙලොවේත් එලොවේත් රජාණෝ ඔබමය.
අපට ඇහුම්කන් දී අපට සෞභාග්‍යය දුන මැනවි.[5]

යජුර් වේදයේ දක්නට ලැබෙන්නේ ඍග් වේදයේ ගීතිකාමය. එහෙත් පූජා කටයුතුවලදී ඒවා භාවිතා වෙන විලාශය පූජකවරුන්ට පෙන්වාදෙන පද්‍ය විස්තර කොටස්ද ඊට ඇතුළත් ය. සාමවේදයද එසේම ඍග්වේදය ආශ්‍රයෙන් තැනුන ග්‍රන්ථයකි. එය පොත් 15කින් සමන්විත ය. එකකට 6ක්ද අනිකට 9ක්ද අත්වන පරිදි එම පොත් සමූහය දෙකකට බෙදා තිබේ. එම කාණ්ඩ දෙකේම සම්පූර්ණ ගීතිකා සංඛ්‍යාව 1549කි. ඒවායින් 78ක් හැර අන්සියල්ලම ඍග්වේදයේ ගීතිකා ආශ්‍රයෙන් තනනලද ඒවාය. සෝම නැමති පලතුරු යුෂ ගැනත් එය මුල්කර ගෙන පවත්වනු ලබන සෝම පූජාව ගැනත් එහි කියවේ. සෝම පූජාව ගැන සඳහන් වන කොටස් හැරුණු විට ඍග් වේදයට අමතර වූ වැඩිදෙයක් එහි නැත.

වේද ග්‍රන්ථ අතරින් වඩාත්ම පසුකාලීනව සකස් වූ එක අතර්ව වේදය වේ. අතර්ව නැමති පූජකයෙකු විසින් රචිත යැයි කියනු ලබන එය මුල්කාලීන වේද ග්‍රන්ථ ලයිස්තුවල සඳහන් වී තිබෙනු දක්නට නැත. ගීතිකා 760කින් පමණ සමන්විත වන එහි පද්‍ය කොටස්ද ඇත. ගීතිකාවලින් හයෙන් එකක් පමණ ඍග් වේදයේ ඒවාමය. උපනිෂඩ් පොත්වල විස්තරාත්මකව ඉදිරිපත් කෙරෙන නිර්පුද්ගල බ්‍රහ්මණ් ආකල්පයද ආත්මන් ආකල්පයද එහි සඳහන්වී තිබෙනු දක්නට ලැබේ.

(ආ) බ්‍රාහ්මණ : වේදයේ ගීතිකා පූජා කටයුතුවලදී භාවිතයට ගන්නා විලාශය බ්‍රාහ්මණ පූජකවරුන්ට පෙන්වාදීම 'බ්‍රාහ්මණ'



පොත් කාණ්ඩයේ අරමුණ වේ. ක්‍රි.පූ. 800 හා 500 අතර බිහිවූ මෙම පොත් පෙළ වත්පිළිවෙත් පිළිබඳ ජනප්‍රවාදවලින් බහුලය. ඒවායින් වැඩි සංඛ්‍යාව පූජකයෙකු නොවන කෙනෙකුට කියවා තේරුම් ගැනීම දුෂ්කරය. ඒවායින් වැඩිම ප්‍රසිද්ධියක් ලබා ඇත්තේ 'සතපතබ්‍රාහ්මණ' යන්නය. 'සත + පත' යන්නේ අර්ථය 'මාර්ග සියයක්' යන්නය.

(ඉ) උපනිෂද් හෙවත් වේදාන්ත : ශ්‍රැති ගණයට අයත් තුන්වෙනි පොත් කාණ්ඩය 'උපනිෂඩ්' වේ. 'උප-නි-ෂඩ්' යන වචනයේ අර්ථය 'ලඟ-බිම-ඉඳගෙන' යන්නය. එයින් අදහස් කෙරෙන්නේ ගුරුවරයාගේ පාදය ළඟ බිම ඉඳගෙන සිටින ශිෂ්‍ය පිරිසකට දෙනු ලබන අනුශාසනාව යන්න ය. උපනිෂඩ් ග්‍රන්ථවල දර්ශනය මුලින්ම එළිදැක්වුනේ එලෙස ය.

උපනිෂද් ග්‍රන්ථවලින් ඉගැන්වෙන කරුණු තරමක් සංකීර්ණය. අභිරහස් භාවයකින්ද යුක්තය. එම නිසාම ඒවා අභිධර්ම (Metaphysical) කෘති සේද ඇතැම්විට සැලකේ. එහෙත් ඉන්දියානු ශිෂ්ටාචාරයට ආවේණික වූ ආගමික චින්තනයට දහම දාර්ශනික ගුරුමතයක ද මුල්වී තිබෙන්නේ ඒවායේ කියැවෙන කරුණුය. එම ග්‍රන්ථවල අන්තර්ගතය වේද ග්‍රන්ථවලින්ම බිහිවූවායැයි සැලකෙන නිසා 'වේදාන්ත' (වේදයේ කෙලවර) යන නමින්ද ඒවා හැඳින්වේ.

උපනිෂද් ගණයට අයත් කෘති සංඛ්‍යාව සාමාන්‍යයෙන් දැක්වෙන්නේ 108ක් සේය. එහෙත් ඒවායින් ඇතැම් ඒවා එතරම් පැරණි නැත. වැදගත්කම අතින්ද බොහෝමයක එතරම් විශේෂත්වයක් නැත. ශාස්ත්‍රීය වැදගත්කමකින් යුත් පැරණිම උපනිෂද් ග්‍රන්ථ ක්‍රි.පූ. (ක්‍රිස්තු පූර්ව)800 හා 300 අතර කාල පරිච්ඡේදයට අයත් වේ. ඒවා පද්‍යයෙන් හෙවත් කවියෙන් සකස්වූ ඒවාද වේ. වඩා පසුකාලීන වූ ග්‍රන්ථ ගද්‍යයෙන් සකස් වී තිබේ. විශේෂ ශාස්ත්‍රීය අගයකින් යුත් පැරණිම ග්‍රන්ථ අතරින් බ්‍රිහද්-අරණ්‍යක උපනිෂදය හා චාන්දෝග්‍ය උපනිෂදය ප්‍රධාන වේ. උපනිෂද් ග්‍රන්ථවල විස්තර වෙන කරුණු අතරින් 'බ්‍රහ්මන් - ආත්මන්' දර්ශනය ප්‍රධාන යැයි කිව හැක.

ඇත්ත වශයෙන්ම ආරම්භයේදී මේ විශ්වය බ්‍රහ්මන්මය. එය තමන් හැඳිනගෙන සිටියේ 'මම බ්‍රහමන්' යනුවෙනි. එම නිසා පවතින හැම දෙයක්ම ඔහු විය. කිසියම් දෙවිකෙනෙක් ඒ බ්‍රහමන් සත්‍යය වටහා ගත්තේ ද ඔහුද එයම විය. දාර්ශණිකයෝද එසේම වූහ. මනුෂ්‍යයෝද එසේම ය. එලෙස ඕනෑම කෙනෙක් 'මම බ්‍රහමන්' කියා වටහා ගත්තේද ඔහුද පවතින ඒ එකම දේ බවට පත්විය.[6]

ඇත්ත වශයෙන් මේ මුළු විශ්වයම බ්‍රහ්මන් ය. හැමකෙනෙක්ම තමා එයින් බිහිවූ බවත්, තමන් හුස්ම ගන්නේ එය තුළ බවත්, යම් දිනක එය තුළට තමා දියවී යන බවත් සිහියේ තබාගෙන එයට වන්දනාමාන කළ යුතු ය.

මගේ හදවත තුළ ඇති මගේ ආත්මය ඉතා කුඩා ය. හාල් ඇටයක් අබ ඇටයක් යන්නටත් වඩා කුඩාය. තණකොල ඇටයකට හෝ එහි මදයට වුවද වඩා කුඩාය. අනිත් අතින් මගේ හදවතේ ඇති ආත්මය පෘතුවියටත් වඩා විශාලය. වායුගෝලයට වඩා විශාලය. අහසට වඩා විශාලය. මේ හැම ලෝකයකටම වඩා විශාලය.

හැම ක්‍රියාවකට ද, පැතුමකට ද ගඳකට හා රසයකට ද, මේ මහා විශ්වයටද පදනම සපයන්නේ මගේ හදවත තුළ නිශ්ශබ්දවද නිසංසලවද පවතින ආත්මය ය. එය බ්‍රහ්මන් ය. මෙතැනින් මා ඉවත්වූ විට මම එයට ඇතුළු වෙමි.[7]

බ්‍රහ්මන්-ආත්මන් දර්ශනය ගැන සේම කර්මය හා පුනරුත්පත්තියේ දර්ශනය ගැනද උපනිෂද් ග්‍රන්ථවල කියැවේ.

මෙලොවදී යහපත් චර්යා රටාවකින් යුක්තවන අයට පූජක (බ්‍රහ්මන්), පාලක (ක්ෂත්‍රිය), වෙළඳ (වෛශ්‍ය) කුලවල ප්‍රසන්න ප්‍රීතිමත් උපතක් ලැබිය හැකිය. නමුත් මෙලොවදී අයහපත් චර්යාවකින් යුත් අයට සුනඛයෙකුගේ, සූකරයෙකුගේ හෝ කුලහීනයෙකුගේ මට්ටමක අප්‍රසන්න අසතුටුදායක උපතක් උරුමවිය හැක.[8]



23 JUL 2019

## II. ස්මෘති

'ස්මෘති' යන නමින් හැඳින්වෙන පොත් වැදගත්කම අතින්, දෙවන ගණයකට අයත් ඒවා සේ සැලකුනද වේදයේ පණිවුඩය සාමාන්‍ය ජනයා අතරට, ඔවුන්ට තේරෙන කථා රටාවකින් ගෙන එන ලද්දේ ඒවා මගින් ය. ස්මෘති ගණයට පොත් වර්ග 5ක් අයත්ය. ඒවා නම්,

1. ධර්මශාස්ත්‍ර හෙවත් ව්‍යවස්ථා ග්‍රන්ථ
2. ඉතිහාස හෙවත් වීර කථා ග්‍රන්ථ
3. 'පුරාණ' හෙවත් වංශ කථා ග්‍රන්ථ
4. 'ආගම' හෙවත් ජනවන්දනා පිළිබඳ ග්‍රන්ථ
5. 'දර්ශන' හෙවත් ජීවිත සත්‍යය පිළිබඳ ගුරුමත ඇතුළත් ග්‍රන්ථය.

1). **ධර්මශාස්ත්‍ර හෙවත් ව්‍යවස්ථා ග්‍රන්ථ:** ධර්මශාස්ත්‍ර සේ ගැනෙන්නේ හින්දු සමාජය පාලනය කිරීමට කලින් කලට බිහිවූ ව්‍යවස්ථා ග්‍රන්ථ ය. හින්දු සමාජයේ ප්‍රධානතම ව්‍යවස්ථා සම්පාදකයින් ලෙස ගනු ලබන්නේ මනු, යඥාවාල්කිය හා පරාෂර ය. එක් එක් යුගයට අවශ්‍ය වූ විලාසයට එක් එක් ජන කොටස මත පැවරුණු යුතුකම් විස්තරාත්මකව ඒවායේ ඉදිරිපත්කර තිබේ. මනු ව්‍යවස්ථාව ඒවා අතරින් ප්‍රධානතම එක වේ. එය 'මනු සංහිතාව' සේද 'මනු ස්මෘතිය'සේද අමතනු ලැබේ.

මනු ව්‍යවස්ථාව ඉතාමත් පැරණිය. එය වේද ග්‍රන්ථවලට පසුව එහෙත් උපනිෂඩ් ග්‍රන්ථ වලට පෙර සකස්වූවක් සේ සැලකේ. එහි නීති මාලාවලට අමතරව දේවකථා වැනි කරුණු ද දක්නට ලැබේ. අද තිබෙන සැටියට එය ගාථා 2685ක් ඇතුළත් පොත් 12කින් සමන්විත වේ. මුල්කාලීන පොත දැන් තිබෙන එකට විශාල වූවායැයිද කියැවේ. මනු සංහිතාවෙන් පාඨ දෙකක් පහත දැක්වේ. එකක් නීතිය පිළිපැදීම ගැනය.

වේදය උගත් පුද්ගලයින් විසින් පිළිපදිනු ලබන ඒ දිව්‍යමය නීතිය හැඳිනගන්න. වෛරයෙන් මෙන්ම

23 JUL 2019

නොහොබිනා ප්‍රේමයෙන්ද වැලකී සිටින යමෙක් වේද, ඔහු තම හදවතින්ම එයට අවනත වේ. එම නීතියට පිටුපා පෞද්ගලික ලාබ ප්‍රයෝජන තකාම වැඩකටයුතු කිරීම වැඩදායක පිළිවෙතක් නොවේ.[9]

හැම කෙනෙක්ම තමන්ට හැකි පමණින් සතුටු සිතකින් ත්‍යාගවන්ත භාවයේ යුතුකම ඉටුකළ යුතුය. ත්‍යාග ලැබීමට සුදුස්සෙක් ලද හොත් පුද සත්කාර තුළින්ද දන් දීමෙන්ද එම යුතුකම ඉටුකළ යුතු ය. යමෙක් යමක් ඉල්ලුවහොත් කන්කෙඳිරි ගාන්නේ නැතුව කුමක් හෝ, එනම්

ඉතාමත් සුළුදෙයක් හෝ දිය යුතුය. සුළු දෙයක් හෝ තමන්ගෙන් ලබන්නෙක් දිනක තමන්ගේ ගැලවුම්කරුවෙකු බවට පත්වෙන්නටද ඉඩ ඇත. පානය දෙන්නෙක් සිතේ සතුටක් ලබන්නේ ය. ආහාර දෙන්නෙක් නොනැසෙන ප්‍රීතියක් භුක්ති විඳින්නේ ය.[10]

2. **ඉතිහාස ග්‍රන්ථ** : ඉන්දීය ඉතිහාසයේ ජාතික වීරයින් සේ සැලකුණ පුද්ගලයන් මුල්කරගෙන ලියන ලද මහාභාරතය හා රාමායණය යන වීර කාව්‍ය දෙක ඉතිහාස පොත් ගණයට අයත් වේ. ජාතික වීරයන්ගේ වීර ක්‍රියා තුළින් වේදයේ දර්ශනය කාවදින සුළු විලාසයකට සාමාන්‍ය ජනයාට ඉදිරිපත් කිරීම ඒවායේ ප්‍රධාන අරමුණ වේ. හින්දු ජනයා ආගම ගැන අදහස් පළමුවෙන්ම ලබාගන්නේ ඒවායින් යැයි කිව හැක. එම නිසාම ඒවායේ කතෘවරුන් සේ ගනු ලබන ව්‍යාස හා වාල්මිකී ඉන්දීය ශිෂ්ඨාචාරයේ නිර්මාතෘවරුන් සේද බහුලව සැලකේ. මෙම වීර කථා දෙක විශ්ව සාහිත්‍යයේ දීර්ඝතම වීර නාට්‍ය දෙක යැයිද කියනු ලැබේ. ග්‍රීක සම්භාව්‍ය සංස්කෘතියේ ප්‍රධාන වීර කථා දෙක ලෙස ගැනෙන 'ඉලායඩ්' (Iliad) හා 'ඔඩිසි' (Odyssy) එකට ගතහොත් මහාභාරතය හත්ගුණයකට වඩා විශාලය. ජේලි 2,20,000කින් පමණ යුක්ත වන මෙය අන්තර්ගත කරුණු අතින් හින්දු ධර්මයේ විශ්ව කෝෂයක් බඳුය. එම නිසා මහාභාරතය වේද ග්‍රන්ථ තරමටම පූජනීය ග්‍රන්ථයක් හෙවත් පස්වෙනි වේද ග්‍රන්ථයසේද ඇතමුන් විසින් සලකනු ලැබේ. නූතන පඬිවරු එය



කතුවරුන් කිහිපදෙනෙකුගේ කෘතියක් බවත්, ක්‍රි.ව. දෙවෙනි හා තුන්වෙනි ශතවර්ෂ අතර නිම වූවක් බවත් පවසති.

මහාභාරතයේ ප්‍රධාන කොටස සේම අරටුව සේද ගනුලබන්නේ 'භගවත් ගීතය' ය. එය භාරත වැසියන්ගේ හදවත පෙන්නුම් කරන කථාව සේද සලකනු ලැබේ. කථා පුවත ඉදිරිපත් කර තිබෙන්නේ අර්ජුන නම් වූ සෙබළකු හා ඔහුගේ රථාචාර්යවරයා ලෙස වෙස්වලාගෙන සිටි ක්‍රිෂ්ණ දෙවියන් අතර සංවාදයක් සේය.

එම සංවාදය ඇතිවන්නේ අර්ජුන යුධපිටියට පිවිසීමත් සමගය. තම ප්‍රතිපාක්ෂිකයින් වී සිටින්නේතම නෑදෑ හිතවතුන්ම බව වටහා ගත්විට ඔවුන් මරුමුවට පත්කිරීම සුදුසුද නැද්ද යන්න පිළිබඳව විශාල දෙගිඩියාවක් අර්ජුනගේ සිතේ ඇති විය. එම නිසා යුද පිටියෙන් පිටවී යෑමට ඔහුට සිතුනේය. ඔහු පිටවී ගියානම් යුද්ධය අවසන් වනු ඇත. කිසිවෙකු නොමැරෙනුද ඇත. එහෙත් දූර්මතවල එල්බගෙන සිටි දූර්යෝධන හා ඔහුගේ හමුදාව ජයග්‍රහණය කර ජනතාවට හානි කරනු ඇත. ක්‍රිෂ්ණ දෙවියෝ ඉදිරිපත් වෙන්නේ එවිට ය. කළයුතු දේ පිළිබඳව කරුණු පහදා දෙමින් ඔහු අර්ජුනගේ දෙගිඩියාව පහකරන්නේය.

ඔහු අර්ජුනට උගන්වන පාඩම මෙය ය. මිනිසා තමන් වෙත පැවරී ඇති යුතුකම එයාකාරයෙන්ම ඉෂ්ඨ කළ යුතුය. ප්‍රතිඵලයේ ඉෂ්ඨ අනිෂ්ඨතාවය සැලකීම ඔහු සතු කාර්යයක් නොවේ. අර්ජුන සෙබළෙකි. ඔහු ඒ සෙබළ කාර්යය ඉටුකළ යුතු ය. එහෙත් එය වෛරයකින් මෙන්ම ආත්මාර්තකාමිත්වයෙන්ද තොරව ආගමික ප්‍රතිපත්ති අනුව ඉටුකළ යුතු ය.

ක්ෂත්‍රිය කුලයට අයත්වූවෙකු වශයෙන් ඔබේ නිල කාර්යය යුද පිටියේ සටන් කිරීමය. ආගමික ප්‍රතිපත්ති මත සටනේ යෙදීමට වඩා හොඳ දෙයක් ඔබට කිරීමට නැත. එම නිසා සටන් කරන්නද නොකරන්නද යන දෙගිඩියාවෙන් පසුවීමට ඔබට හේතුවක් නැත. යුධකිරීමේ අවස්ථා සොයන්නට යන්නේ නැතිව ඒවා ඉබේම මෙන් ලබන ක්ෂත්‍රියයෝ වාසනාවන්තයෝ ය. දේව ලෝකවල දොරටු ඔවුන්ට විවෘතව

ඇත. එහෙත් කුමන හේතුවක් නිසා හෝ ඔබ මේ ආගමික යුද්ධයේ නොයෙදෙන්නේ නම්, යුතුකම් පැහැර හැරීමේ පවට ඔබ වැටෙන්නේ ය. සටන්කරුවෙකුගේ කීර්තිය ඔබට අහිමි වී යනු ඇත.[11]

යුතුකම් ඉටුකිරීමේ වැදගත්කම පිළිබඳ ඒ මහඟු පාඩමින් මුලපුරා මිනිසෙකුට අත්පත්කරගත හැකි ඉහළම මිනිස්කම හෙවත් පරිපූර්ණ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳවත් ක්‍රිෂ්ණ දෙවියෝ අර්ජුනට අනුශාසනා කිරීමට පටන් ගන්නේ ය. පරිපූර්ණ විමුක්තියට මග කියාදෙන්නේ ය. උගන්වනු ලබන එක පාඩමක් මෙසේ ය.

මිනිසෙක් තමන් ඉහළට ඔසවා ගත යුතු ය. පහලට පහත්කර ගත යුතු නැත. කාර්යයන් දෙකටම යොදාගත හැකි උපකරණය මනස ය. කය තුළ හිරවී සිටින ආධ්‍යාත්මයේ මිතුරා මෙන්ම හතුරාද මනස මය. හිත දමනය කරගෙන සිටින තැනැත්තාට මනස හොඳම මිතුරාය. දමනය කර ගැනීමට අසමත් වී සිටින තැනැත්තාට මනස බියකරුම හතුරාය.

හිත දමනය කරගෙන සිටින තැනැත්තා විශ්ව මහා ආත්මය තුළට පිවිසී ඇත. චිත්ත සාමය අත්පත් කරගෙන ඇත. එවැනි කෙනෙකුට ප්‍රීතිය හා දුක, උෂ්ණ හා සීතල, කීර්තිය හා අපකීර්තිය ඒකාකාරය. තම මිනිස් පැවැත්ම පරිපූර්ණත්වයට ඔසවාගත් තැනැත්තා යෝගියෙකි. (දෙවියන් හා එක්වූවෙකි). ඔහුට ජීවිතය පිළිබඳ හරි අවබෝධයක් ඇත. ඔහුගේ පැවැත්ම ලෝකෝත්තර මට්ටමකය. ඔහු තුළ තම පාලනය තම අතේ ය. ඔහු හැම දෙයක්ම, එනම් ගල්කැට වේවා රත්තරන් වේවා - දකින්නේ එකම විලාසයකටය . . . . .

ලෝකෝත්තර පුද්ගලයෙක් විශ්ව මහා ආත්මය හැම විටම අවධානයට යොමු කළ යුතු ය. ඔහු තනිවම නොවිසිරුණු මනසකින් යුතුව විසිය යුතුය. ප්‍රවේශමෙන් සිත පාලනය කර ගත යුතු ය. නොහොබිනා ආශාවලින් හා වස්තු තණ්හාවෙන් මිදී සිටිය යුතුය.[12]



රාමායණය යන කෘතිය භගවත් ගීතාව ඇතුළත් මහාභාරතය තරම්ම විශාල කෘතියක් නොවේ. එයින් කියැවෙන්නේ ඉන්දියානු ඉතිහාසයේ වීරයෙකු සේ ගැනෙන රාම යන රාජ්‍ය කුමාරයා පිළිබඳ කථාවය. රාමාට එරෙහිව ඔහුගේ පියාගේ දෙවන බිසවක හා ඇගේ පුත්‍රයා විසින් මෙහෙයවන ලද කුමන්ත්‍රණයක් නිසා ඔහුට තම රජ මාලිගය අතහැර යාමට සිදුවේ. අවුරුදු 14කකාලයක් ඔහු වනගත වී සිටින්නේ ය. ඒ අතරතුරේ ඔහුට නිරතුරුවම විශ්වාසී වූ තම භාර්යාව වන සීතා දුෂ්ට යක්ෂයෙකු විසින් පැහැරගෙන යනු ලබන්නේ ය. සීතාව සොයාගැනීමට තනියම ඔහු දැරූ හැම ප්‍රයත්නයක්ම ව්‍යර්ථ වූ පසු හනුමාන් නැමති වානරයාගේ සහය ඔහුට ලැබේ. සීතා හා රාමා එක්කිරීමට හනුමාන් සමත් වේ. රාමා, සීතා හා හනුමාන් යන තිදෙනා අද ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසකගේ ගෞරවයට පාත්‍ර වී තිබේ. ඔවුන් අද දේවත්වයෙන්ද පුදනු ලැබේ.

3. **පුරාණ** : පුරාණ යනුවෙන් හැඳින්වෙන පොත් සමූහයද ඉන්දියාවේ පොදු ජනයගේ අධ්‍යාපනයට බොහෝ සෙයින් හේතුවී ඇත. පෞරාණික කථා සේ ගනු ලබන කථාවස්තූන් ඒවාට අයත් වන නිසාම, ඒවා 'පුරාණ' සේ හැඳින්වේ. බ්‍රහ්ම දෙවියන් ඇදහූ බැතිමතුන් විසින් බ්‍රහ්ම ගැනද, විෂ්ණු දෙවියන් ඇදහූ බැතිමතුන් විසින් විෂ්ණු ගැනද, ශිව දෙවියන් ඇදහූ බැතිමතුන් විසින් ශිව ගැනද ලියන ලද කෘති එයට ඇතුළත් වේ. ඒවායින් ප්‍රධාන වශයෙන් කියැවෙන්නේ එම දෙවිවරුන්ගේ අවතාර ගැන ය.

විෂ්ණු දෙවියන් ගැන කියන පොත්වල එම දෙවියෝ මත්ස්‍ය, ඉබි, නාරසිංහ (සිංහ-මිනිස්) වැනි ස්වරූපවලින් දසවතාවක් මිනිස් සමාජය තුළ දිස් වූ බව කියැවේ. දුක්පීඩාවට පත්වූ අවස්ථාවල මිනිසා එයින් මුදවාලීමටත්, අධර්මය රජයන අවස්ථාවල ධර්මය පිහිටුවාලීමටත් දෙවියෝ ඉදිරිපත්වන බව එම අවතාර කථාන්තරවලින් ප්‍රකාශවෙන මූලික පණිවුඩය වේ. වෛශ්නවවාදීන්ගේ පොත් අතරින් කල්කි වශයෙන් විෂ්ණුගේ අනාගත අවතාරය ගැන කියන 'විෂ්ණු පුරාණය' ද, ක්‍රිෂ්ණගේ

ජීවිතය, ධර්මය හා එඬේර ළඳැරියන් වෙත ඔහුගේ ආදරය ගැන කියන'භගවත් පුරාණය' ද වඩාත්ම ජනප්‍රිය දෙක වේ. 'ශිව පුරාණ', 'ස්කන්ධ පුරාණ','ලිංග පුරාණ ශිව බැතිමතුන්ගේ භක්ති ආදරයට ලක්වූ පොත් වේ. පුරාණ ගණයට අයත් පොත් ක්‍රි.ව. පළමු හා දස වෙනි ශතක අතර නිර්මාණය වී ඇතැයි සැළකේ.

4. **ආගම** : ආගම නමින් හැඳින්වෙන්නේ හින්දු බැතිමතුන්ගේ පූජෝපහාරයට මුල් වන ප්‍රධාන දෙවිවරුන් ගැනද, එම දෙවිවරුන්ට පුද නමස්කාර කළ යුතු විලාශය ගැන ද, කරුණු දක්වන පොත් පෙළමය. විෂ්ණු දෙවියන්, ශිව දෙවියන් හා ශක්ති දේවිය මාතෘකා කරගත් පොත් වෙන් වෙන් වශයෙන් එහි දක්වා තිබේ. විෂ්ණු දෙවියන් ගැන කියන පොත් සමූහය 'පංචරාත්‍ර' (Pancharatra) සේ හැඳින්වේ. ඒවා වෛශ්නව වාදයේ ප්‍රධාන මූලාශ්‍ර වේ. ශෛව ආගම් හෙවත් පොත් ශෛවසිද්ධාන්ත දර්ශනය මූලාශ්‍ර වේ. ශක්ත ආගම් හෙවත් පොත්වලින් පරම සත්‍ය විශ්වමාතාව යනුවෙන් හැඳින්වේ. එම විශ්ව මාතාව දේවි යන නමින් අමතනු ලැබේ.

ශක්ත දර්ශනය බහුලව හැඳින්වෙන්නේ තන්ත්‍රවාදය සේ ය. 'තන්'යන මුල් අර්ථයෙන් යුත් 'තන්ත්‍ර' යන්න මෙහි ගැනෙන්නේ 'මූලික ඉගැන්වීම්' යන අදහසිනි. බුද්ධාගමේ සේම හින්දු ආගමේද තන්ත්‍රවාදය සේ ගනු ලබන්නේ යෝගී උපක්‍රම, සංකේතාත්මක වන්දනා ක්‍රම යනාදිය තුළින් සාමාන්‍ය ආශාවන් මැඩපවත්වාගෙන පරම සත්‍ය හා එක්වීමේ එක්තරා ධර්ම මාර්ගයක් ය. අනියම් ලිංගික සංවාසයද එය සඳහා යොදාගනු ලබනවා යැයි යන චෝදනාව මත, තාන්ත්‍රික ක්‍රමය අද තරමක අපකීර්තියට ද පත්ව ඇත. එහෙත් එම දර්ශනයේ එකම අරමුණ බැතිමතුන් තුළ දැඩි අනාත්මාර්ථකාමී හික්මීමක් ඇති කරවීම බව ද මෙහි සඳහන් කළ යුතුව ඇත.

5. **දර්ශන** : දර්ශන යනුවෙන් හැඳින්වෙන්නේ වේදය ආශ්‍රයෙන් බිහි වූ විවිධ දර්ශන ක්‍රම විස්තර කරන පොත් ය. ඒවා මූලික වශයෙන් බුද්ධිමතුන්ගේ හෙවත් දාර්ශනිකයන්ගේ භාවිතය සඳහා පුරාණ හා ආගම් සේ සාමාන්‍ය ජනයා සඳහා නොවේ. දර්ශන



ක්‍රම හයක් ඒවායින් ඉදිරිපත් කෙරී ඇත. ඒවා අතර ඇති සම්බන්ධය අනුව ඒවා සාමාන්‍යයෙන් වර්ග තුනකට බෙදනු ලැබේ.

1. ගෞතමගේ න්‍යාය දර්ශනය හා කණාදගේ වෛශේෂිත දර්ශනය

2. කපිලගේ සංඛ්‍යා ශාස්ත්‍රය හා පතඤ්ජලීගේ යෝග දර්ශනය

3. ජෛමිනීගේ මීමංසා දර්ශනය හා බාදරායනගේ වේදාන්ත දර්ශනය[13]

හැම දර්ශන කෘතියකම එම දර්ශනය ආරම්භකයාගේ කියමන් ඇතුළත් සූත්‍ර දක්නට ලැබේ. ඒවාට එක් එක් අටුවා හා ටීකා ද ඇත. මෙම දර්ශන පොත් අතරින් වේදයේ දේව ධර්මයට පැහැදිලිවම අනුකූල වන්නේ විමංසා හා වේදාන්ත යන දෙකය. ඒ දෙකෙන් ද වේදයේම විස්තරයක් සේ ගත හැක්කේ වේදාන්තය. ඒ උපනිෂද් ග්‍රන්ථවල විචාරයක් සේ ද සාමාන්‍යයෙන් සලකනු ලැබේ.

ස්මෘති ගණයට අයත් මේ හැම කෘති වර්ගයක් ම වේදයෙන්ම බිහි වූ ඒවා සේ සැලකේ. ව්‍යවස්තා, ඉතිහාස පුරාණ ආගම් හා දර්ශන යන හැම එකකම අරමුණ ද වේදයේම අරමුණ යැයි කිව හැක. ඒ අරමුණ නම් මිනිසා සිය මිනිස් දුර්වලකම්වලින් මුදවා දෙවියන් හෙවත් පරම සත්‍ය හා එක්වී වසන පරිපූර්ණ මනුෂ්‍යයෙකු කරවීමය. එයට අවශ්‍ය වාතාවරණය ඔහුගේ හදවතෙහි ද සමාජය තුළ ද ඇති කරවීමය.

## ආන්තික සටහන්

1. ඒ. එල්. බෂාම්, අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1995 (තෙවන මුද්‍රණය), 1 පරිः 1-2 පිටු.
2. සනත් නානායක්කාර, බුදුදහම හා ශ්‍රී ලංකාවේ සෙසු ආගම්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2001 (ප්‍රථම මුද්‍රණය), 27 පිට.
3. ඒ. එල්. බෂාම්, අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1995 (තෙවන මුද්‍රණය) , 1 පරි : 34 පිට.
4. ගල්ලෑල්ලේ සිරිසුමන හිමි, ආගම දර්ශනය, කර්තෘ ප්‍රකාශන, කොළඹ, 1999 (ප්‍රථම මුද්‍රණය) 1 පරිः.
5. ඍග්වේද සංහිතා, ed.N.S. Sontakke and C.G. Kashikar, Vaidikasamsodhamandala, 1946.
6. Brhadaranyaka Upanisad, 1:4, (Trans), Rai Bahadur Srisachandra Vasu Vidyarnava, Chowkhamba Sanskrit Series Office, Vavanasi, 2001(Reprint).
7. The Thirteen Principal Upanishads Chandogya u: 3 : 14 (Trans)Robert Ernest Hume, Oxford University Press (London) 1934.
8. The Thirteen Principal Upanishads Chandogya u: 5 : 10 (Trans)Robert Ernest Hume, Oxford University Press (London) 1934.
9. මනුස්මෘති : 2 : 1 සංස්. ප්‍රාණජීවශර්මන්, ගුජරාතී මුද්‍රණාලය, මුම්බායි, 1913.
10. මනුස්මෘති : 4 : 227 - 229 සංස්. ප්‍රාණජීවශර්මන්, ගුජරාතී මුද්‍රණාලය, මුම්බායි, 1913.
11. භවත් ගීතා, 3 : 31 - 33, බඹරුන්දේ සිරිසීවලි, පෑලියගොඩ විද්‍යාලංකාර ප්‍රකාශන, කැලණිය, 1946 (ප්‍රථම මුද්‍රණය).
11. එම, 6 : 5 - 10.
12. සංස්කෘත සාහිත්‍යය, ජී.එස්.බී. සේනානායක, ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, 1960 (ද්විතීය විස්තෘත සංස්කරණය), 123 - 148 පිටු.

# ආන්තික සටහන්


1. ඒ. එල්. බෂාම්, අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1995 (තෙවන මුද්‍රණය), 1 පරි: 1-2 පිටු.
2. සනත් නානායක්කාර, බුදුදහම හා ශ්‍රී ලංකාවේ සෙසු ආගම්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2001 (ප්‍රථම මුද්‍රණය), 27 පිට.
3. ඒ. එල්. බෂාම්, අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1995 (තෙවන මුද්‍රණය) , 1 පරි : 34 පිට.
4. ගල්ලෑල්ලේ සිරිසුමන හිමි, ආගම දර්ශනය, කර්තෘ ප්‍රකාශන, කොළඹ, 1999 (ප්‍රථම මුද්‍රණය) 1 පරි:.
5. ඍග්වේද සංහිතා, ed.N.S. Sontakke and C.G. Kashikar, Vaidikasamsodhamandala, 1946.
6. Brhadaranyaka Upanisad, 1:4, (Trans), Rai Bahadur Srisachandra Vasu Vidyarnava, Chowkhamba Sanskrit Series Office, Vavanasi, 2001(Reprint).
7. The Thirteen Principal Upanishads Chandogya u: 3 : 14 (Trans)Robert Ernest Hume, Oxford University Press (London) 1934.
8. The Thirteen Principal Upanishads Chandogya u: 5 : 10 (Trans)Robert Ernest Hume, Oxford University Press (London) 1934.
9. මනුස්මෘති : 2 : 1 සංස්. ප්‍රාණජීවශර්මන්, ගුජරාතී මුද්‍රණාලය, මුම්බායි, 1913.
10. මනුස්මෘති : 4 : 227 - 229 සංස්. ප්‍රාණජීවශර්මන්, ගුජරාතී මුද්‍රණාලය, මුම්බායි, 1913.
11. භවත් ගීතා, 3 : 31 - 33, බඹරුන්දේ සිරිසීවලි, පෑලියගොඩ විද්‍යාලංකාර ප්‍රකාශන, කැලණිය, 1946 (ප්‍රථම මුද්‍රණය).
11. එම, 6 : 5 - 10.
12. සංස්කෘත සාහිත්‍යය, ජී.එස්.බී. සේනානායක, ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, 1960 (ද්විතීය විස්තෘත සංස්කරණය), 123 - 148 පිටු.